# 15 අභියෝග මැද මෙහෙවර

පාවුල්තුමාගේ තෙවන ධර්මදූත ගමන එපීසය මූලික කොටගෙන සිදු විය. එහි දී පාවුල්තුමා මුහුණදුන් අභියෝග සඳහා අවස්ථාවෝචිත ලෙස ප්‍රතිචාර දැක්වී ය. එම ආදර්ශයන් අනුගමනය කරමින් එලදායි ධර්මදූත මෙහෙවරකට යොමුවීම මෙම පාඩමින් අපේක්ෂිත ය.

ක්‍රියා 18: 23 - 21: 19

## තෙවන ධර්මදූත ගමන

අප මෙම පාඩමින් අධ්‍යයනය කරන්නට යන්නේ පාවුල්තුමාගේ තෙවන ධර්මදූත ගමනයි. එය එපීසය නම් නගරය මූලික කොටගෙන සිදුවූවකි. එම ගමනට තිමෝතියස්, ත්‍රෝපිමස් හා ලූක් පාවුල් සමග හවුල් වූහ.

ක්‍රි. ව. 53 සිට 54 දක්වා කාලයේ දී කිලෝ මීටර් 4024 ක් පමණ දුරක් ඔවුන්ගේ ගමනට ඇතුළත් වූ බව පෙනී යයි.

කලින් පිහිටුවන ලද සභා ශක්තිමත් කරමින් ගලාතිය හා පිරිගිය පළාත් මැදින් ඔවුහු ගමන් කළහ. (ක්‍රියා 18: 23)

## එපීසය

ප්‍රසිද්ධ වෙළෙඳ නගරයක් වූ එපීසය සුළු ආසියාවේ අග නගරය විය. ලොව පුදුම හතෙන් එකක් ලෙස සැලකෙන ප්‍රසිද්ධ අර්තේමිස්ගේ දේවාලය මෙහි පිහිටා තිබිණි. පාවුල්තුමා වසර 2 ක් පමණ එපීසයේ නැවතී සිටියේ ය. ඔහු විවිධ අභියෝගවලට එහි දී සාර්ථක ලෙස මුහුණ දුන් බව ක්‍රියා පොත සාක්ෂි දරයි.

කියවා බලමු.

ක්‍රියා 18: 24-19: 10

### එපීසයේ සිදුවීම්

| | |
|---|---|
| අකිලා හා ප්‍රිස්කිලා - | අපොල්ලොස්ට හමුවීම. ඔහු ව්‍යක්ත කථිකයෙකි, ධර්ම දේශකයෙකි. ස්නාවක ජොහාන්ගේ බෞතිස්මය ගැන පමණක් දැන සිටි කෙනෙකි. අකිලා ප්‍රිස්කිලා ඔහුට දෙවියන් වහන්සේගේ මාර්ගය වඩා හරි ලෙස පහදා දුනි. |
| පාවුල් - | ස්නාවක ජොහාන්ගේ ශ්‍රාවකයන් සහ ග්‍රීක්වරුන් හමුවීම. ස්නාවක ජොහාන්ගේ ගෝලයන්ට ජේසුස් වහන්සේ ගැන පහදා දීම. ඉන් පසුව බෞතීස්ම කරන ලදුව, අත් තැබූ කල ශුද්ධාත්මයාණන් වහන්සේ ඔවුන් වෙත පැමිණි විට අන්‍ය භාෂාවලින් කථා කිරීම. ග්‍රීකවරුන්ටද දේව වචනය ප්‍රකාශ කෙරුණි. |

මෙය පාවුල්තුමා එපීසයේ දී ජයගත් අභියෝගයකි



මැසිදෝනියය
අකායිය
ක්‍රීතය
මධ්‍යධරණී මුහුද
මිසරය
සයිප්‍රස්
ගලාතිය
කිලිකිය
සිරියය
රෝදස්
කෝස්
කොරින්තිය
ඇතැන්ස්

කියවා බලමු.

## ක්‍රියා 19: 11-17

සංචාරක ජුදෙව් යකැදුරන් හා ස්කේවාගේ පුත්‍රයන් සත් දෙනකු පාවුල්තුමා තුළින් බොහෝ ප්‍රාතිහාර්ය සිදුවන බව දැක, පාවුල් දේශනා කරන ජේසුස් වහන්සේගේ නාමයෙන් ප්‍රාතිහාර්ය සිදුකිරීමට උත්සාහ කරන ලදී.

මෙම යකැදුරන් විසින් ජේසුස් වහන්සේගේ නාමය වැරදි ලෙස භාවිත කිරීම නිසා තමන්ට ම විනාශය ඇති කර ගති.

### මෙම අභියෝගය හමුවේ අත් දුටු ප්‍රතිඵල

- ❖ දේව බලය ප්‍රකාශ වීම
- ❖ නපුර හා අසත්‍ය විනාශ වීම
- ❖ ජේසුස් වහන්සේගේ නාමයට ගෞරවය ඇතිවීම
- ❖ යන්ත්‍ර මන්ත්‍ර අභ්‍යාස කළ බොහෝ දෙනෙක් එම මාර්ගවලින් හැරී දෙවියන් වහන්සේ අදහා ගැනීම.
- ❖ දේව වචනය බලවත් සේ වැඩී වර්ධනය වී පැතිර යාම.

කියවා බලමු.

## ක්‍රියා 19: 23-41

"අත්වලින් සෑදූ දෙවිවරු, දෙවිවරු නොවේ ය" යන පාවුල්තුමාගේ ඉගැන්වීම හේතුවෙන්,

අර්තේමිස් දේවාලයේ රිදී රූප ව්‍යාපාරයට පහර වැදීම.

දෙමෙත්‍රියස් නම් රිදී රූප සාදන්නා පාවුල් ඇතුළු කණ්ඩායමට විරුද්ධව කටයුතු කිරීම.

පාවුල්ට විරුද්ධව එපීසයේ කෝලාහලයක් හට ගැනීම.

නගර සභා ලේකම් තැන කෝලාහලය සන්සිඳුවීම.

මිත්‍යා මත රූප වන්දනාවෙන් මිනිසුන් වළක්වා එක ම සැබෑ දෙවිඳුන් නමස්කාර කිරීමට ඔවුන් යොමු කිරීමේ අභියෝගයට පාවුල් ඇතුළු පිරිස මුහුණ දුන්හ. එහි දී අත්වලින් සෑදූ පිළිම / රූප නමස්කාරය අර්ථ විරහිත බව පෙන්වා දුනි.

### මෙම අභියෝගය හමුවේ අත්දුටු ප්‍රතිඵල

මිනිසුන් රූප වන්දනාවෙන් වැළකීම හේතුවෙන් රිදී රූප ව්‍යාපාරයට පහර වැදීම.

එක ම සැබෑ දෙවිඳුන් නමස්කාර කිරීමේ වැදගත්කම අවබෝධ කරගැනීම.

## එපීසය අවට නගරවල ධර්මදූත සේවය

**කියවා බලමු.**

**ක්‍රියා 20:1 - 21:19**

එපීසයේ කෝලාහලය සංසිඳුනු පසු පාවුල් එහි සිටි ශ්‍රාවකයන් ධෛර්යවත් කොට ග්‍රීසියට පැමිණ ජුදෙව්වරුන්ගේ පීඩාවන් මැද සේවය කරමින් ගමනෙහි යෙදුණි.
(ක්‍රියා 20: 1-6)

ත්‍රොවසයේ දී යුතිකස්ට ප්‍රාතිහාර්යාත්මක ලෙස නැවත පණ දීමේ සිද්ධිය අභියෝගයක් ලෙස භාර ගති. (ක්‍රියා 20: 7-12)

එපීසයේ සිටි සභා මූලිකයන් මිලේතසයට කැඳවා සිය සේවය පිළිබඳ තොරතුරු ඔවුන් සමග බෙදා ගති. ඔවුන්ට නව ඇදහිලිවතුන්ගේ වගකීම පවරා ඔවුන්ගෙන් සමු ගැනීමේ අභියෝගයට ද මුහුණ දුනි.

අගබස් ප්‍රකාශ කළ තමාට විය හැකි පීඩාව දැන දැන, අධෛර්යයට පත් නොවී ජෙරුසලමට යාමේ අභියෝගයට ද ඔහු මුහුණ දුනි.

මෙසේ පාවුල් හා තම පිරිස තෙවන ධර්මදූත ගමන සාර්ථක කර ගැනීම සඳහා දිරියෙන් හා කැපවීමෙන් ක්‍රියා කළහ. මුහුණ දීමට තිබූ අපමණ බාධා හා අභියෝග ජයගනිමින් ශුද්ධාත්ම දිරිය හා සවිය තුළ සේවය කළහ.

දෙවියන් වහන්සේ වෙනුවෙන් අපගේ සිත යොදවන විට, අපට වැඩ කරන්නට සිදු වන්නේ, අභියෝගාත්මක පරිසරයක ය. එවන් විට ශුද්ධ වූ පාවුල්තුමා මෙන්, අභියෝග ජය ගැනීමට, ශුද්ධාත්ම සවිය ලබමින් ගමන් කරමු.

**ක්‍රියාකාරකම්**

1. එපීසයේ දී පාවුල්තුමාට මුහුණ දීමට සිදු වූ අභියෝග පෙළ ගස්වන්න.

2. ඔබට මුහුණදීමට සිදුවන අභියෝග පරාජය කිරීම සඳහා පාවුල්තුමා අනුගමනය කරමින් ඔබ ක්‍රියාකරන අයුරු පහදන්න.